  

2015 2016 2017



## ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගම්පහ

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිම

## நிறுவனத்தின் பெயர்: மாவட்ட செயலகம் கம்பஹா

**பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்**

## Name of Institution: District Secretariat – Gampaha

**Submission of observation of Hon Minister and steps taken with regard to the reports tabled by the committee on Public Account in terms of Standing Order No.119(4)**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය: ගම්පහ**

| රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු මා මහපෙන්වීම් | ගණන් දීමේ නිළධාරී විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| **1.** බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව නිරන්තරයෙන් කටයුතු කරනු ලබන අතර මේ පිළිබඳව මාසිකව හා ත්‍රෛයිමාසිකව විගණන අධිකාරියට පිටපත් සහිතව පසුවිපරම් කරනු ලැබේ. 2020 වර්ෂයේ කොවිඩ් 19 වසංගත තත්වය යටතේ චෙක්පත් බැංකුවට ඉදිරිපත් වීම ප්‍රමාදවීම හා චෙක්පත් අස්ථානගතවීම නිසා අදාල රෙගුලාසි අනුගමනය කරමින් හිලව් චෙක්පත් නිකුත් කිරීමට සිදු විය. ඇතැම් භාණ්ඩ හා සේවාවන් සැපයීම ප්‍රමාද වීම නිසා චෙක්පත් ලබාදීමේ ප්‍රමාදයක් අනාවරණය වූ අතර හැකිතාක් දුරට මෙම තත්වය පාලනය කරමින් කටයුතුකර ඇත. එම සියළුම චෙක්පත් නිරවුල් කර ඇති අතර මහර සේප්පුවේ මුදල් සොරකම නිසා උපලබ්ධි නොවූ තැන්පතු 24ක රු.19,447ක මුදල බැංකුගත කල නොහැකි වී ඇත. | ඒ අනුව මහර මුදල් වංචාව නිසා බැංකුගත නොවූ තැන්පතු 24ක මුදල වූ රු.19,447ක මුදල පමණක් තවදුරටත් පවතින අතර එම මුදල අදාල මුදල් වංචාව සම්බන්ධ පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් පසුව අදාල ගැලපීම් සිදුකර නිරවුල් කිරීමට බලාපොරොත්තු වේ. |
| **2.** මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි. | වර්ෂය තුල පියවිය යුතු බැරකම් හැකිතාක් දුරට එම වර්ෂය තුලදීම පියවීමට විශේෂ වැඩපිළිවෙලක් යොදා ඇති අතර ඒ තුල ඉදිරි වර්ෂය තුල නිරවුල් කල යුතු බැරකම් හැකිතාක් දුරට අවම කර ගැනීමට හැකිවිය. තවද 2019 වර්ෂ අවසානයට අනාවරණය වූ බැරකම් වලින් 1101 හා 1402 පිළිවෙලින් රු.340,919ක් හා රු. 24,150ක මුදල 2020 ප්‍රතිපාදන මත දරා ඇත. කෙසේ වෙතත් අදාල ප්‍රතිපාදන සීමාව තුල බැරකම් වලට එළඹෙන ලෙස දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රදේශීය ලේකම්වරු දන්වා ඇත. | 2022 වර්ෂයේ ඉතිරි ප්‍රතිපාදන සීමාව තුල අදාල බැරකම් වලට එළඹීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| **3.** වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | මේ පිළිබඳව නිරන්තර පසු විපරම් කරන අතර හිඟ ණය ශේෂ බොහෝමයක් පසුගිය වසර කිහිපය තුල අය කරගෙන ඇති අතර ඉදිරියේදී අදාල නිලධාරීන් විශ්‍රාම ගැන්වීමෙන් පසු තවදුරටත් මෙම ශේෂ වලින් කොටසක් අයකර ගැනිමට අදහස් කෙරේ. | 2022 වර්ෂය තුල හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් සකස් කල අතර ඒ තුලින් **රු.551,294**ක මුදලක් අයකරගෙන ඇත. 2023 වර්ෂයේදී එම ආකාරයෙන්ම ඉතිරි හිඟ ණය ශේෂය වන රු.1,759,431.47ක මුදලද අයකර ගැනීමට බලාපොරොත්තු වේ. |
| **4.** පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රේ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පොදු තැනපත් ගිණුමේ ශේෂ නිරවුල් කිරිම සඳහා පසුගිය වර්ෂ කිහිපය තුලම විධිමත් වැඩපිළිවෙලක් සකස් කර බොහෝමයක් ශේෂ නිරවුල් කිරිමට කටයුතු කර ඇති බව දන්වමි. එසේම වන්දි ගෙවීම් නිරවුල් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් යොදා ඇති අතර අධිවෙගී මාර්ග සඳහා අත්පත් කර ගැනීම් යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවිම නිසා ලබා නොගෙත් වන්දි මුදල් වැඩි ප්‍රමාණයක් මෙම මුදල නියෝජනය වන අතර එම එකඟතාවයන් ලැබෙන තෙක් අදාල වන්දි මුදල් තැන්පත් ගිණුමේ රඳවා ගැනීමට සිදුවේ. තවද ඉඩම් ආරවුල්, වන්දි ලාභීන් විදේශගතවීම ආදී හේතුමත මෙම වන්දි මුදල් නිරවුල් කිරීම ප්‍රමාද වීම සිදුවේ. කෙසේ වෙතත් මෙම තැන්පතු ශේෂ 2023 වර්ෂය තුල හැකිතාක් නිරවුල් කිරිමට කටයුතු කරමි. | 2022.12.31 වන විට, තැන්පතු ගිණුම් අංක 6000-0-0-1-0-61 (ඇප තැන්පත්), 6000-0-0-2-79 (ටෙන්ඩර් තැන්පත්) , 6000-0-0-13-49 (තෙවන පාර්ෂව වෙත ගෙවීම්) හා 6000-0-0-18-39 (ව්‍යවස්ථාපිත ගෙවීම්) යටතේ වර්ෂ 2ට වැඩි කිසිදු තැන්පතුවක් නොමැති අතර කොන්ත්‍රාත් රැඳවුම් (6000-0-0-16-31) යටතේ වසර 2ට වැඩි තැන්පතු ශේෂය වන රු.14,104,972.11ක මුදල නිරවුල් කිරිමට කොන්ත්‍රාත් කරුවන් දැනුවත් කර ඇති අතර 2023 වර්ෂයේදී නිරවුල් කිරිමට බලාපොරොත්තු වේ.<br>එසේම ඉඩම් තැන්පතු (6000-0-0-17-0-10) යටතේ තවදුරටත් පවතින වසර 5ට වැඩි තැන්පතු ශේෂය වන රු.198,669,879.20ක මුදල ඉඩම් ආරවුල් නිසා නිරවුල් කිරිමේ ගැටළු පැන නැඟි ඇත. එම ශේෂද 2023 වර්ෂය තුල නිරවුල් කිරීමට බලාපොරොත්තු වේ. |
| **5. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**<br>මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ උන්නාරුව පිහිටි ග්‍රාම නිලධාරී නිල නිවසේ 1990 වසරේ සිට පදිංචිව | මෙම ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමකි. 1970-1977 කාලය තුල මෙම ගොඩනැගිල්ල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉදිකර ඇත. පසු කාලයේදී ග්‍රාම නිලධාරී කාර්යාලයක් පවත්වාගෙන ගිය අතර එම ගොඩනැගිල්ල ගරා වැටීම හේතුවෙන් ග්‍රාම නිලධාරි කාර්යාලය ඉවත් කරගෙන ඇත. පසුව එම ගොඩනැගිල්ලේ | මේ සම්බන්ධයෙන් 2022.08.26 වන දින පවත්වන ලද දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටුවේදී සාකච්ජා කල අතර ඒ අනුව මෙම ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් බැවින් අනවසර පදිංචිය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති |

| | | |
|---|---|---|
| සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරිමට කටයුතු කර නොතිබුණි. | අනවසර පවුලක් පදිංචි වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නඩු පැවරීමකදී බුක්තියට පමණක් අදාල වන පරිදි නඩු තීන්දුව පදිංචි කරුවන්ට වාසි දායක වන ලෙස ලබා දී ඇත. පසුව නැවත සන්තකය අපසු ලබා ගැනිම පිණිස සිදු කරන ලද නඩු පැරීමකදී එම නඩු පැවරීමේදී සිදු වු දෝෂයන් මත නඩුව නිෂ්ප්‍රභා වී ඇත.<br><br>එබැවින් එම ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති බව තහවුරු වන බැවින් සන්තකය ආපසු ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත වගකීමක් නොමැති අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරිම පිණිස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලිඛිතව දන්වා ඇතත් ඒ සම්බන්ධයෙන් මේ දක්වා පිළිතුරක් ලැබී නොමැත. | රාජකාරියක් බැවින් ඉදිරි කටයුතු කිරිමේ බලය අදාල කොමිෂමට පැවරිමට තීරණය කරන ලදී. |
| **6.** 2014 වර්ෂයේ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වු මුදල් වංචාව | බස්නාහිර පළාත් සභාවට, මධ්‍යම රජයට හා සමෘද්ධි දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුව පිළිවෙලින් රු.915,786, රු.126,459.42 හා රු40,000ක් වේ. ඒ අනුව මධ්‍යම රජයට සිදු වූ පාඩුව අදාල පුද්ගලයන්ට මාස 3ක කාලයක් ඇතුලත වාරික වශයෙන් හෝ එකවර සම්පූර්ණ මුදලම ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ගෙවන ලෙස දිස්ත්‍රික් ලේකම්ගේ අංක.දිලේ/P/1/16 හා 2021.11.01 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. එසේම 2021.12.14 දිනැතිව බස්නාහිර පළාත් සභාවට අයවිය යුතු අලාභය වෙනුවෙන් රු.228,946.50 බැගින් ගෙවන ලෙස ඔවුන්ට දැනුම් දී ඇත. | i. කළමනාකරණ සේවා නිලධාරිනියන් දෙදෙනා විසින් මේ සම්බන්ධව අධිකරණයේ ක්‍රියාත්මක වන නඩුව විභාග වෙමින් පවතින බැවින් ඒ අනුව කටයුතු කරන බව ලිපියක් මගින් දන්වා ඇත. ඒ අනුව දිස්ත්‍රික් ලේකම්ගේ අංක. දිලේ/P/1/16 හා 2022.02.14 දිනැති ලිපිය මගින් අදාල මුදල් අප්‍රමාදව ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.<br><br>ii. එසේම එවකට සිටි මහර ප්‍රාදේශීය ලේකම් හා ගණකාධිකාරී යන අය විසින් අලාභය ගෙවීමට නොහැකි බව දන්වා ඉදිරිපත් කර තිබු ලිපි දිස්ත්‍රික් ලේකම්ගේ අංක.දිලේ/P/1/16 හා 2022.02.11 හා 2022.02.17 දිනැතිව ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. |

| | | |
|---|---|---|
| | | iii. නමුත් ,අදාල වගකිව යුතු නිලධාරීන් සියලුදෙනාම අලාභය හානි පූර්ණය කිරීම සඳහා කිසිදු එකගතාවක් නොමැති බැවින් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක F/DA/06/WRI02/003 හා 2022.02.10 දිනැති ලිපියට අනුව නව පරීක්ෂණ මණ්ඩලයක් මගින් නැවත මුරෙ104(1) ආ ප්‍රකාරව පරීක්ෂණයක් පැවැත්වීමට අදාල මණ්ඩලය නම්කර අනුමැතිය සඳහා 2022.03.22 දිනැතිව ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙතට ඉදිරිපත් කර ඇත.<br><br>iv. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නව පරීක්ෂණ මණ්ඩලය සඳහා 2022.04.08 දිනැතිව අනුමැතිය ලබාදී ඇති අතර ඒ අනුව දිලේ/P/1/16 හා 2022.04.21 දිනැතිව නව පරීක්ෂණ මණ්ඩලයක් පත්කරන ලදි.<br><br>v. නව පරීක්ෂණ මණ්ඩල වාර්තාවේ තීරණයද පෙර පරිදිම අදාල නිලධාරීන්ගෙන් සමානව අයකරගැනීම වන බැවින්, රේඛීය අමාත්‍යාංශයේ විමර්ශන අංශයෙන් සුදුසු විධිමත් පරීක්ෂණයක් සිදුකිරීම නිර්දේශ කර 2022.10.20 දිනැතිව නව කමිටු වාර්තාව අමාත්‍යාංශය වෙත යවා ඇත. |

..............................

වී.ඩී.එස්.රොඩ්රිගෝ,

ප්‍රධාන ගණකාධිකාරි ,

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය.

වී.ඩී.එස්. රොඩ්රිගෝ
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගම්පහ.

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග මගින් 2023 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ලඟාකර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)
අග්‍රාමාත්‍යතුමා සහ
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍ය.